**මධ්‍යම පරිසර අධිකාරිය - 2017**

**-----------------------------------------------------**

මධ්‍යම පරිසර අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 6(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත 2018 ජුලි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------------**

මගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටීන් සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 88 ඡේදය ප්‍රකාරව අස්පෘෂ්‍ය වත්කම් රේඛීය අයිතමයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශන මුහුණතෙහි ඇතුළත් කළ යුතු වුවද, අධිකාරිය සතු රු.819,322 ක් වූ මෘදුකාංග වෙනම හඳුනා ගැනීමකින් තොරව දේපල පිරියත හා උපකරණ පිරිවැය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) මධ්‍යම පරිසර අධිකාරියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබූ රු. 5,507,674 ක මූල්‍ය නොවන වෙනත් මෙහෙයුම් වියදම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ බදු පෙර ලාභයට ගලපා නොතිබුණි.

- 2016 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.6,491,054 ක දේපල, පිරියත හා උපකරණ වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑමක් ලෙස හා සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ප්‍රදාන යටතේ බදු පෙර ලාභයට මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

- කෙරීගෙන යන වැඩ තුළ ඇතුළත් රු.42,665,352 ක මූල්‍ය නොවන ගනුදෙනු ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑමක් ලෙස දක්වා තිබුණි.

- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වෙන් කිරීම් රු.387,785 ක් එම ව්‍යාපෘතියට අදාල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ බදු පෙර ලාභයෙන් අඩුකර දක්වා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07
----------------------------------------------

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව වත්කමක ඵලදායී ජීවිතකාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කලයුතු වුවත්, එසේ සිදුකිරීමකින් තොරව දොම්පේ සනීපාරක්ෂක කසල රඳවනයේ ඵලදායී ජීවකාලය වූ වර්ෂ 20 වෙනුවට කිසිදු පදනමකින් තොරව වර්ෂ 40 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(ii) යන්ත්‍ර හා පිරියත සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.213,403 ක ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණද ප්‍රමිතයේ 86 ඡේදය ප්‍රකාරව ඊට අදාල ක්ෂය අනුපාතිකය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09
---------------------------------------------------

ප්‍රමිතයේ 47 (අ) ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් තොග ගණනය කළ පිරිවැය සූත්‍ර මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

### 2.2.2.1 මධ්‍යම පරිසර අධිකාරිය
---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබූ රු. 6,491,054 ක් වූ විද්‍යාගාර උපකරණ සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කර තිබුණද, එම වටිනාකම රඳවාගත් ඉපැයුම්වලට බැර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමෙන් අඩුකර දක්වා තිබූ අතර ඊට අදාල ක්ෂය රු.30,232 ක් සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මෝටර් රථ ක්ෂය රු.391,249 කින් වැඩියෙන් හා අනෙකුත් දේපල, පිරියත හා උපකරණවල ක්ෂය රු. 494,016 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් ලැබිය යුතු ආදායම් රු.3,850,714 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2015 හා 2016 වර්ෂවල භාවිතයෙන් ඉවත්කළ වාහන අපහරණයෙන් ලද රු.2,544,324 ක් සමාලෝචිත වර්ෂයේදී ඒකාබද්ධ අරමුදලට බැර කර තිබූ අතර එය රඳවාගත් ඉපැයුම් වලට ගැලපීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) පාරිසරික බලපෑම් ඇගයීම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලැබී තිබූ මුදලින් පරීක්ෂණ කටයුතු අවසන්ව තිබූ වසර 03 කට වඩා පැරණි රු. මිලියන 49.33 ක ශේෂයක් ආදායම් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට අදාල උපචිත වියදම් අධි වෙන්කිරීම් රු.219,571 ක් රඳවාගත් ඉපයීම්වලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් වලින් අඩුකර දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු.338,364 ක් වූ උපචිත වියදම් ගිණුම් ගතකර නොතිබුණි.

(උ) එකතුව රු.14,947,726 ක් වූ පුනරාවර්තන වියදම් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

### 2.2.2.2 පිළිසරු ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් 07 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.3,164,347 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයක් දක්වා තිබුණද, අවසන් බිල්පත් වලින් අඩුකර තිබූ රු.416,310 ක් එම ගිණුමෙන් මෙහෙයුම් වියදම්වලට මාරුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවාගැනීම් මුදල් රු.976,164 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කොන්ත්‍රාත් බිල්පත් වටිනාකම රු.19,942,995 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රමාදයන් සඳහා අය කරන ලද (Liquidation damages) රු.902,596 ක් ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාල උපචිත වියදම් අධි වෙන්කිරීම් රු.568,946 ක් රඳවාගත් ඉපයීම්වලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළිසරු ව්‍යාපෘතියේ උපචිත වියදම් තුළ එකතුව රු.1,630,847 ක් වූ හර ශේෂ දක්වා තිබුණද මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියට අදාල ඉකුත් වර්ෂයේ ගැලපුම් වටිනාකම රු.45,947 ක් රඳවාගත් ඉපැයුම්වලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ තැන්පතු ලෙස දැක්විය යුතු රු.2,884,421 ක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පළාත්පාලන ආයතන හා අනෙකුත් ආයතනවල කොම්පෝස්ට් අංගන ඉදිකිරීමට අදාල ව්‍යාපෘතිවලට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස දක්වා තිබූ රු.223,665,869 ක් සම්බන්ධයෙන් බිල්පත් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු පාරිසරික බලපැම් ඇගයීම් අත්තිකාරම් ශේෂ 08 ක එකතුව වූ රු.61,524 ක් සමාලෝචිත වර්ෂයේ දී ද නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන් 06 දෙනෙකුගෙන් වර්ෂ කිහිපයක සිට අය නොවී පැවති රු.1,083,076 ක් වූ ආපදා ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ උපචිත වියදම් ලෙස දක්වා තිබූ වැය විෂයයන් 06 ක එකතුව වූ රු.2,282,518ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත | සෑම කාර්තුවක් අවසානයේදීම මුද්දර බදු වශයෙන් අයකරගන්නා ලද මුදල් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය තුළ එකතුකරන ලද මුද්දර බදු රු.3,561,268 ක් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XXIX වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය | මුල්වරට පත්වීම් ලබන නිලධාරීන් තම වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 454 හා 751 | සියළුම ලැබීම් හා නිකුත් කිරීම් භාණ්ඩ බඩුලේඛන පොතෙහි ඇතුළත් කර නිසි පරිදි ගණන් තැබිය යුතු බව දැක්වෙතත්, පිළිසරු ව්‍යාපෘතියේ තොග වාර්තා පොත් ඒ අනුව නඩත්තු කර යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අයිතම 08 ක අතිරික්තතා 24 ක් හා අයිතම 11 ක ඌනතා 132 ක් හඳුනාගෙන තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ
------------

| | |
|---|---|
| (i) 1971 ජුලි 26 දිනැති අංක 810 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් වන අයකර ගැනීම එම නිවාඩු ලබාගත් මාසයේම හෝ ඊළඟ මාසයේ වැටුපෙන් සම්පූර්ණයෙන්ම අයකර ගත යුතු වුවද, එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 1994 ජනවාරි 21 දිනැති අංක 328 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ගිවිසුම්ගත වීමකින් තොරව ඉන්ධන පිරවුම් හල් 24 ක එකතුව රු.1,155,500 ක අත්තිකාරම් තැන්පත් කර තිබුණි. |
| (iii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිළිසරු ව්‍යාපෘතිය විසින් පරිගණක සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iv) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) අනුරාධපුර හා නුවර දිස්ත්‍රික් කාර්යාල සඳහා ලබාදී තිබුණු රු.15,000 ක සුළු මුදල් අත්තිකාරම් පසුගිය වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේ දී ද දෙසැම්බර් 31 දිනට පියවීම් කර නොතිබුණි.<br>(ii) අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමවූ විගසම පිය විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකකදී ගෙවන ලද රු.24,300 ක් වූ අත්තිකාරම් සම්පූර්ණයෙන්ම පියවා නොතිබූ අතර අවස්ථා 06 කදී ගෙවන ලද රු.88,500 ක් වූ අතුරු අග්‍රිම පියවීම සඳහා දින 36 සිට දින 69ක් දක්වා ප්‍රමාද කර තිබුණි. තවද, අවශ්‍යතාවය ඉක්මවා අවස්ථා 57 ක දී රු.1,762,465 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**
----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතියට අදාල පාරිතෝෂික දීමනා එම ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් ගෙවීමට අනුමැතිය ලැබී තිබියදී, රු.679,800 ක පාරිතෝෂික පිළිසරු ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

(ආ) නිලධාරීන් වාර්ෂිකව ඉතිරිකර ගත් වෛද්‍ය නිවාඩු සඳහා දීමනා රු. 21,006,163 ක් ගෙවා තිබියදී, 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිලධාරීන්ගෙන් දායකත්ව මුදල් අයකිරීමකින් තොරව සැත්කම් හා රෝහල් ගාස්තු රක්ෂණයක් වෙනුවෙන් රු.10,796,255 ක් අධිකාරියේ අරමුදල් මගින් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ හා ඊට අදාල ව්‍යාපෘති දෙකෙහි ඌනතාවය රු.58,942,000 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,142,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.104,084,000 ක පිරිහීමක් ඇති වී තිබුණි. සුළු පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීමේ වැඩසටහන් වියදම් රු.133,733,000 කින් හා තිරුබද්දු හා අනෙකුත් වියදම් රු.15,784,000 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේ රු.28,610,438 ක් වූ ඌනතාවය 2015 වර්ෂය අවසානයට රු.72,318,000 ක ඌනතාවයක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ නමුත් 2016 වර්ෂයේදී රු.45,142,000 ක අතිරික්තයක් ඇතිවී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු.58,942,000 ක ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.369,820,312 ක් වූ දායකත්වය 2016 වර්ෂයේ අවසානයට රු.743,306,000 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.669,680,000 ක් දක්වා පහත වැටී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 10 වන වගන්තියට අනුව, දක්වා තිබූ ප්‍රධාන අරමුණු 18 ක් අතුරින් පහත සඳහන් අරමුණු ඉටුකිරීම අවම මට්ටමක පැවති අතර ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වැඩි වගකීමක් අධිකාරියට පැවරී ඇති අතර පිළිසරු ව්‍යාපෘතිය මගින් කොම්පෝස්ට් ව්‍යාපෘති ආරම්භ කර තිබුණද ජාතික ගැටලුවක්ව පවතින අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්කර පරිසරයට හා ජනතාවට සිදුවන පරිසර හා සෞඛ්‍යමය අහිතකර තත්ත්වය අවම කිරීම කෙරෙහි අවධානය යොමුවීම අවම මට්ටමක පැවතුණි.

(ආ) පළාත් පාලන ආයතනයක පාලන සීමාව ඇතුළත පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ යම් යම් නිර්දේශ සහ කසල අපද්‍රව්‍ය, කසල සහ මළ අනවසරයෙන් බැහැර කිරීම, පිටකිරීම හෝ තැන්පත් කිරීම තහනම් කිරීම, පස, ඇලමාර්ග හෝ දිය මාර්ග කරා පිළිසකර නොකළ මළ හෝ උප ප්‍රාමාණික කාර්මික පිටාර ගැලීම් හෝ විෂ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම් වැලැක්වීම යන අංග සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ අනුව ක්‍රියා කරන ලෙස ඒ ඒ පළාත් පාලන ආයතනයට නියම කිරීම 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනතට අනුව අධිකාරිය සතු බලයක් වුවද ඒ සඳහා වැඩි අවධානයක් යොමුකර නොතිබුණි.

(ඇ) ජාතික ගැටළුවක්ව පවතින නගරාසන්න ප්‍රදේශ තුළ එකතු වන කසල සම්බන්ධයෙන් රට තුළ සුළු හෝ මධ්‍ය පරිමාණයෙන් යුක්තව කසළ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ඇතිවන අතුරු ඵලයක් වන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය තුළින් රසායන පොහොර භාවිතයට විකල්ප විසඳුමක් ලබා දීම හා පරිසර හානිය අවම කිරීමට මෙන්ම අධිකාරියට ආදායමක් ලබා ගැනීම යනාදී කරුණු සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් දැක්වීම අධිකාරිය සතු වගකීමක් වුවද ඒ සඳහා වැඩි අවධානයක් යොමු කර නොතිබුණි.

(ඈ) ජාතික පාරිසරික පනතේ සඳහන් අරමුණු හා ප්‍රධාන කාර්යයන් අතර පරිසරය කරා අපද්‍රව්‍ය සහ දූෂිත ද්‍රව්‍ය පිටවීමට සහ පරිසරයේ තත්ත්වය ආරක්ෂා කිරීමට මෙන්ම වැඩිදියුණු කිරීමට අදාල සියළු විධිමත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණ කිරීම අධිකාරිය සතු වගකීමක් වුවද බොහෝ පළාත් පාලන ආයතන විසින් නගරාශ්‍රිතව එකතුවන කසළ අපද්‍රව්‍ය බැහැර කිරීම පරිසරයට මෙන්ම ජනතාවගේ සෞඛ්‍යය ආරක්ෂාව සම්බන්ධ බරපතල ගැටළුවක් වන බැවින් ඊට කඩිනමින් විසඳුම් ලබාදීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමුවීම අවම මට්ටමක පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සතුව ප්‍රාදේශීය කාර්යාල 18 ක් කුලී පදනම මත පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂයේදී රු. 13,967,560 ක් කුලී ගාස්තු ලෙස ගෙවා තිබූ නමුත් ස්ථිර ඉඩම් ලබාගෙන ගොඩනැගිලි ඉදිකිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරිය වෙත පවරා ඇති දොම්පේ සනීපාරක්ෂක කසල රඳවනයේ රු.2,225,291 ක ආදායම් අධිකාරියේ ගිණුමට බැර කර තිබුණද ඊට අදාළ වියදම් රු.3,232,431 ක් අධිකාරිය මගින් දැරීම වෙනුවට පිළිසරු ව්‍යාපෘතිය මගින් දරා තිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල සඳහා ඒ ඒ පළාත්වල ලංකා බැංකු ශාඛාවන්හි පවත්වා තිබූ රැස්කිරීමේ ගිණුම් 14 ක සමාලෝචිත වර්ෂය මුළුල්ලේම පැවති රු.70,935,172 ක බැංකු ශේෂය ප්‍රධාන කාර්යාලයීය ජංගම ගිණුමට මාරු කිරීමකින් තොරව රඳවා ගෙන තිබුණි. ඒ අනුව මනා මූල්‍ය කළමනාකරණයක් නොවීම හේතුවෙන් එම අරමුදල් අධිකාරියට අයත් මෙහෙයුම් කාර්යයන් ඉටුකර ගැනීමට හෝ ආයෝජනය කිරීම තුළින් ආදායම් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

(ආ) සමෝධානික සම්පත් කළමනාකරණ (IRM) ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂයේ ලද රු.1,288,713 ක ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපයෝජනය කර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තක්සේරු කළ වටිනාකම රු.800,000 ක් වූ වෑන් රථයක් වර්ෂයක කාලයක් හා මුහුදු ජලයට හසුවීම හේතුවෙන් ධාවනයෙන් ඉවත්කර තිබූ වාහනයක් වර්ෂ 06 ක කාලයක් අධිකාරි භූමියේ නිෂ්ක්‍රීයව තිබුණද එම වාහන අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පිරිවැය රු.1,552,490 ක් වූ ප්‍රතිචක්‍රීයකරණ අපද්‍රව්‍ය ගබඩා කළ හැකි ටෙන්ට් 05 ක් වර්ෂයක කාලයක් අධිකාරියේ රථගාල තුළ භාවිතයෙන් තොරව පැවතුණි.

**4.5 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපල වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

පිළිසරු ව්‍යාපෘතියට නිත්‍යානුකූල හිමිකමක් නොමැති ඉඩමක රු.1,200,734 ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ නමුත් එම ඉඩමේ අයිතිය නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංර්ධන අරමුණු ළඟා කර ගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” ප්‍රකාරව, සෑම රාජ්‍යයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව අධිකාරිය විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න සම්බන්ධයෙන් දැනුවත් වී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණි. එහෙත් එම ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හා දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

**6. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද අධිකාරිය සහ ඊට අයත් ව්‍යාපෘති 02 කට අදාලව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ දින 83 ක ප්‍රමාදයක් සහිතව එනම් 2018 මැයි 22 දිනය.

## 6.2 ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------------

### 6.2.1 ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව, රු.250,000 ඉක්මවන වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තු සහ රු. 500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත් සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2017 අගෝස්තු 31 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව, නිෂ්පාදකගේ සහතිකය සහ නිෂ්පාදකගේ වගකීම් සහතිකය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රතික්ෂේප කළ යුතු ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමකින් තොරව එම සැපයුම්කරුගෙන් රු.8,028,200 ක් වටිනා කම්පන විශ්ලේෂණ උපකරණයක් මිලදීගෙන තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 අනුව, කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් පමණක් අත්තිකාරමක් ලෙස ගෙවිය හැකි වුවද මීගස්වැව යෝජිත සනීපාරක්ෂක කසල රඳවන ව්‍යාපෘති භූමියේ රු.5,546,557 ක ආරක්ෂිත වැටක් ඉදිකිරීමට අදාල කොන්ත්‍රාත්තුව වෙනුවෙන් උතුරුමැද පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත සියයට 36 ක් එනම් රු.2,000,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

### 6.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 33,536,000 ක් වූ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ක්‍රියාත්මක ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 ජුනි 29 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, මෙම වාර්තාවේ දින වන විටත් ව්‍යාපෘතියේ සැළසුම් අදියරේ කටයුතු පමණක් අවසන්කර තිබූ අතර ව්‍යාපෘති කාලසීමාව 2021 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් අදාල ණය හා පොලිය වසර 10 ක සහන කාලයකින් පසු වාර්ෂික පොළිය සියයට 0.15 ක් යටතේ වසර 40 කින් ගෙවා නිමකළ යුතු අතර මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම දීර්ඝ ලෙස ප්‍රමාද වීම හේතුවෙන් ලබා ගත් ණය පියවීමේදී විශාල වශයෙන් මූල්‍යමය අවාසියක් ඇතිවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය ඉකුත් වී දින 150 ක් ඇතුලත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් 2015 හා 2016 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා 2018 ජූලි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.4 සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බස් ඩිපෝ 114 ක් අතුරින් ඩිපෝ 14 ක් පමණක් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන තිබූ අතර ඩිපෝ මගින් අපජලය හා අපද්‍රව්‍ය බාහිර පරිසරයට මුක්ත වීම හේතුකොටගෙන ශාක, සත්ව හා පසට සැලකිය යුතු ප්‍රමාණයකින් හානියක් සිදුවන බැවින් ඒ සම්බන්ධයෙන් අධිකාරියේ අවධානය යොමුවිය යුතු බව නිරීක්ෂණය විය.

(ආ) පොලිතීන්, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම මෙන්ම පොලිතීන්, ප්ලාස්ටික් වැනි දිරාපත් නොවන අපද්‍රව්‍ය විධිමත් ලෙස පරිසරයට අපහරණය කර කළමනාකරණය කිරීම සඳහා වැඩි දායකත්වයක් ලබාදීම අධිකාරියේ වගකීමක් වුවද එකී කාර්යය ක්‍රියාත්මක කළ පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය අතරමග නතර කිරීම තුළින් අපේක්ෂිත අරමුණු කරා ලඟා වීමට අධිකාරිය අපොහොසත් වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | වියදම් නිසි පරිදි වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම, ක්ෂය නිවැරදිව ගණනය නොකිරීම හා කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිණුම් තැබීම් නිවැරදිව සිදු නොකිරීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | පාරිසරික පනත අනුව අධිකාරියට ලැබී ඇති බලතල ක්‍රියාත්මක නොකිරීම, අතුරු අග්‍රිම, අත්තිකාරම් හා බඩු ලේඛන පොත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර නොතිබීම, වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම, නිවැරදි වැටුප්තලවල පිහිටුවීම හා උසස්වීම් අනුමත ක්‍රමවේදයන්ට අනුව ඉටුකර නොතිබීම. |
| (ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පාලනය | නියමිත දිනට ව්‍යාපෘති නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඉ) වාහන පාලනය | අපහරණය කළ යුතු වාහන අපහරණය කිරීමට කටයුතු නොකිරීම, රක්ෂණ වන්දි නියමිත පරිදි ලබා ගැනීමට කටයුතු නොකිරීම, වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඊ) වත්කම් පාලනය | නිෂ්ක්‍රීය වත්කම් නැවත පරිහරණයට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබීම, වාහන භාවිතා කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම. |